| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| **තෙවන වාර පරීක්ෂණය - 2018** | | |
| **පෙරදිග සංගීතය** | **12 ශ්‍රේණිය** | කාලය පැය තුනයි |

## II පත්‍රය

- I කොටසින් ප්‍රශ්න දෙකකට ද II කොටසින් ප්‍රශ්න එකකට ද III කොටසින් ප්‍රශ්න දෙකකට ද වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

### I කොටස

1.

i. පහත දැක්වෙන ස්වර සංගති ආශාවරී රාගයට අනුව නිවැරදි ස්වර සංඥා යොදා නැවත ලියන්න.

a. ධධ, පමප, ගරිස

b. රිමප, නිධප

c. මපධ, මප, ග, රිස

d. රිමපස, ධප

e. මප, ධධස

(ලකුණු 10)

ii. ආශාවරී රාගයේ මධ්‍යලය ගීතය ස්ථායි කොටස නියමිත තාල සංඥා සහිතව ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 6)

iii. ආශාවරී රාගයට අනුව මාත්‍රා 8කින් සහ මාත්‍රා 16කින් යුත් තානාලංකාර දෙකක් ලියන්න. (ලකුණු 4)

2. පහත දැක්වෙන්නේ නිර්දේශිත හින්දුස්ථානී රාගයන්හි ආරෝහණ සහ අවරෝහණ ස්වර පිහිටීමකි. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. ස, රිමප, නිස̇
2. ස, රිමප, ධස̇
3. සරිමප, ධ නි ස̇
4. ස නි ධ, ම ග, ම ග රි ස
5. ස̇, පධ, මග, සරිග, සනි̣

i. ඉහත 1, 2, 3, 4, 5 ආරෝහණ අවරෝහණ අයත් රාග නම් කරන්න. (ලකුණු 10)

ii. ඉන් සමප්‍රකෘති රාග යුගල දෙක නම් කරන්න. (ලකුණු 2)

iii. ඉන් එක් සමප්‍රකෘති රාග යුගලයක සමානතා 3ක් සහ විෂමතා එකක් ලියන්න. (ලකුණු 4)

iv. ඉහත 1, 2, 3, 4, 5 යටතේ දැක්වෙන රාග අතරින් ඔබ කැමති රාගයක සර්ගමය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 4)

3. පහත වගු සටහනේ දැක්වෙන්නේ සංගීත පද්ධති 3ක තාල පද්ධතියේ තොරතුරු ඇතුළත් අසම්පූර්ණ වගුවකි.

| හින්දුස්ථානි තාල | බටහිර තාල (Time Signature) | දේශීය තිත් |
|---|---|---|
| *a*……………………… | 3<br>4 | *b*…………………………………. |
| ත්‍රිතාල් | *c*…………………………… | *d*…………………………………… |
| *e*………………………. | *f*…………………………… | සුළු මැදුම් දෙතිත |
| දීප්චන්දි | *g*……………………….. | *h*…………………………………… |

i. ඉහත $a, b, c, d, e, f, g, h$ හිස්තැන් සම්පූර්ණ කිරීමට අදළ නිවැරදි කරුණු ලියන්න. (ලකුණු 8)

ii. ඉහත $b$ හෝ $d$ හි බෙර පදය නියමිත පරිදි තිත් සංඥ යොද ප්‍රස්ථාර කරන්න. (ලකුණු 4)

iii. දෙතිතේ ප්‍රභේද 3 නම් කරන්න. (ලකුණු 3)

iv. ඣප් තාලය හෝ දීප්චන්දි තාලය නියමිත තාල සංඥ යොද ප්‍රස්තාර කරන්න. (ලකුණු 5)

## II කොටස

4.

i. උත්තර හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවල සමානකම් 4ක් ලියන්න. (ලකුණු 8)

ii. උත්තර හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවල විෂමතා පහත සඳහන් කරුණු ඔස්සේ වගුගත කරන්න. (ලකුණු 12)

1. භාෂා ව්‍යවහාරය
2. මේල සංඛ්‍යාව
3. ප්‍රධාන මේලය
4. ගීත ආකෘතිය
5. ගායන ශෛලීන් (ගීත ප්‍රබන්ධ විධි)
6. සංගීත භාණ්ඩ (ස්වර/ තාල)

5.

i. නූර්ති සහ නාඩගම් නාට්‍ය සම්ප්‍රදයන්ට නාට්‍යමය ලක්ෂණ දෙක බැගින් වෙන වෙනම ලියන්න. (ලකුණු 8)

ii. නූර්ති හා නාඩගම් සංගීතයේ සුවිශේෂී ලක්ෂණ දෙක බැගින් වෙන වෙනම ලියන්න. (ලකුණු 8)

iii. රාගාශ්‍රිත නූර්ති ගී දෙකක් ඊට අයත් රාගයේ නම සමඟ ලියන්න. (ලකුණු 4)

## III කොටස

6. පහත දක්වා ඇත්තේ දේශීය ජන ගී යටතේ එන ගැමි ගී පාදයන් කීපයකි.

A. දේවතා දුවක් ඇවිදින් කියන්නේ
B. වරම් වරම් සක්‍ර මහ බඹු අතින් වරම්
C. කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
D. බැද්දේ ගියා වැලක් සොයා ගන්නට කියා
E. ඕඩි හෙළෙයි හෙළ වටකර මුළුල්ලා
F. වෙල් යායක ගොන් දෙන්නෙක් කකා උනි
G. කරුවල තොටේ මම බැසලා නාන කොට
H. තණ්ඩලේ දෙන්න දෙපොළේ දක්කනවා

i. ඉහත ගැමි ගී පාද අයත් ගී වර්ග නම් කරන්න. (ලකුණු 8)

ii. දී ඇති ගී පාද ආඝාත්මක සහ අනාඝාත්මකව වෙන්කර ලියන්න. (ලකුණු 4)

iii. ආඝාතාත්මක හා අනාඝාත්ත්මක වීමට බලපාන සුවිශේෂී හේතුව දක්වන්න. (ලකුණු 3)

iv. ගැමි ගීවල විශේෂ ලක්ෂණ 5ක් ලියන්න. (ලකුණු 5)

7. පහත විස්තර දක්වා ඇත්තේ හින්දුස්ථානි ගායන ශෛලීන් කීපයක් පිළිබඳවයි.

(අ) හෝලි උත්සවය ආශ්‍රිතව, ස්ථායි අන්තරා ආකෘතියට මාත්‍රා 14කින් යුත් තාලයකට අනුව ගායනා කරන සංකීර්ණ ගායනා ශෛලියකි.

(ආ) ගුණකරමින් ගයන අතර ගායකයින් "කලාවන්ත" නමින් හඳුන්වයි.

(ඇ) විලම්භයෙන් හා මධ්‍යලයෙන් ගීත ගායනා කරන අතර ස්ථායි අන්තරා ආකෘතියට අයත් ගායනා ශෛලියකි

(ඈ) දේවාල ආශ්‍රිතව ගොඩනැගුණු භක්ති රසයෙන් යුත් ගායන ශෛලියකි.

(ඉ) අංක 4කින් යුත් ප්‍රබන්ධ ගායනා ශෛලියේ ලා ගැනෙන හින්දුස්ථානී ගායනා ශෛලියකි

i. ඉහත දක්වා ඇති ගායන ශෛලීන් 5 නම් කරන්න. (ලකුණු 5)

ii. ඉන් ගායන ශෛලීන් තුනක් පිළිබඳව පහත දැක්වෙන කරුණු යටතේ විස්තර කරන්න. (ලකුණු 15)

a. ආරම්භය හා ව්‍යාප්තිය

b. ගීත ආකෘතිය හා තාල භාවිතය

c. ගායන ශිල්පීන් හා ගායන අංග

8. පරිඝනකය ආශ්‍රයෙන් සංගීත නිර්මාණකරණයේ යෙදීම වර්තමානයේදී දක්නට ලැබෙන සුවිශේෂී අංගයකි.

i. පරිගණකය හා සම්බන්වන පහත සඳහන් කොටස් වලින් තුනක් කෙටියෙන් හඳුන්වන්න.

1. monitor
2. keyboard
3. mouse
4. system unit
5. speaker

(ලකුණු 12)

ii. "සංගීත සංරක්ෂණය" යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න. (ලකුණු 8)